මීගමුව අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම 2024

ප්‍රායෝගික තාක්ෂණික කුසලතා

Learning Resource Centre R De Mazenod College Kandana

විභාග අංකය:.. 8 වසර

නම:.. කාලය පැය 02

1 හා 2 කොටස

සැලකිය යුතුයි :

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 15 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

1 කොටස

1.ව්‍යාපෘති ක්‍රියාවලියෙහි මූලික කාර්යයන් ගණන කීයද?

(i) 3 (ii) 2 (iii) 4 (iv) 6

2.භූමිය බෑවුම් නිසා පස සෝදා යාම වලක්වා ගැනීමට යොදා ගන්නා උපක්‍රමයක් වන්නේ?

(i)බද්දන්ගත වගා ක්‍රමය (ii)ජල බිංදු සම්පාදනය (iii)ශාක කප්පාදුව (iv)අජීවී බාධක යෙදීම

3.ජල ප්‍රභව ආශ්‍රිත කර්මාන්තයක් නොවන්නේ?

(i)ධීවර කර්මාන්තය (ii)සංචාරක කර්මාන්තය (iii)ඇගලුම් කර්මාන්තය (iv)කෘෂි කර්මාන්තය

4. ඖෂධීය ශාක සම්පතක් වන්නේ?

(i) රතු ඇල්ගී (ii) නෙලුම් (iii) සැල්විනියා (iv) නීරමුල්ලිය

5. ගොවිපොලක සතුන් ඇති කරන ක්‍රම කීයද?

(i) 3 (ii) 5 (iii) 6 (iv) 8

6.රට ඇතුලට නෙරාගිය පහත් භූමි ප්‍රදේශයකට සාගර ජලය එක් රැස් වී නිර්මාණය වනුයේ?

(i) කලපු (ii) ඩෙල්ටා (iii පොකුණු (iv) වැව්

7.මහවැලි ගඟ පිටාර ගැලීම නිසා ඇති වූ විල්ලුව කුමක් ද?

(i) කුමන විල්ලුව (ii) කන්දකාඩු විල්ලුව (iii) හඳපාන විල්ලුව (iv) බුන්දල විල්ලුව

8.හස්ත හා විසිතුරු කර්මාන්ත සඳහා යොදා ගතහැකි ශාකයක් නොවන්නේ.

(i)දුනුකෙයියා (ii)තුන්හිරියා (iii)නෙලුම් අල (iv)බොරුපන්

9. අධිශීතකරණයේදී ආහාර ද්‍රව්‍ය ගබඩා කරන උශ්නත්වය වන්නේ?

(i) 15c (ii) -18c (iii) 20c (iv) -12c

10. යෝගට් සෑදීමේ කියාවලියේදී ඒ සඳහා මිශ්‍ර කරනු ලබන්නේ?

(i) අයිස් කැට (ii) රට ඉදි (iii) මුහුන් (iv) ලුණු

11.ආහාරයක් නරක් වීමට බලපාන සාධකයක් නොවන්නේ?

(i) භෞතික ක්‍රියා (ii) ජීව ක්‍රියා (iii) රසායනික ක්‍රිය (iv) සමාජීය ක්‍රියා

12.වියලි උණුසුම් වාත ධාරාවක් යැවීමෙන් ජලය වාශ්ප ලෙස ඉවත් වීමට සලස්වනු ලබන උපකරණය වනුයේ?

(i) අධි ශීතකරණය (ii) ශීතකරණය (iii) විජලනය යන්ත්‍රය (iv) පීඩන උදුන

13. ජලාශ සුපෝශනය වූ විට එහි වර්නය දක්නට ලැබෙන්නේ?

(i) කහ (ii) කොල (iii) රතු (iv) නිල්

14. විජලනය සඳහා යොදා ගන්නා ආහාරයක් නොවන්නේ?

(i) කරවිල (ii) වම්බටු (iii) හතු (iv) කෙසෙල්

15.තක්කාලි මේරීමේ දර්ශකයට අදාල නොවන්නේ කුමක් ද?

(i) නරක්වූ තක්කාලි (ii) තරමක් පැසුනු තක්කාලි (iii) ඉදුණු තක්කාලි (iv) පැසුනු තක්කාලි

---

02 කොටස

- 1වන ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

1. නිවැරදි පිළිතුර තෝරා හිස් කොටුව සම්පූර්ණ කරන්න.



2.

i) ගෙවත්තක් පවත්වා ගැනීමට හේතු වූ කරුනු 2ක් සඳහන් කරන්න.

ii) ඔබ ගෙවත්තෙන් ලබා ගන්නා වාසි 3ක් නම් කරන්න.

iii) සැලසුම් සහගත ගෙවත්තක් යන්න කෙටියෙන් හඳුන්වන්න.

iv) ගෙවත්තක් සැකසීමේදී සැලකිලිමත් වියයුතු කරුණු 2ක් සඳහන් කරන්න.

3.

i) ග්‍රහන ශාක මොනවාදැයි හඳුන්වාදී ඉන් වර්ග 4ක් සඳහා උදාහරණ ශාක එක බැගින් ලියා දක්වන.

ii)ගෙවත්තක් පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටලු කොටස් 4ක් යටතේ විස්තර කරන්න.

4

i) ගොවිපොල සතුන් ගෙන් ලබාගන්නා නිශ්පාදන 4ක් ලියන්න.

ii) ගොවිපොල සතුන් ඇතිකරන ක්‍රම 3 කුමක් ද?

iii) වාතය දූෂණය කරන වායු වර්ග 2ක් ලියන්න.

iv) සුපෝශනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

5

i) නරක්වූ ආහාරයක දැකිය හැකි ලක්ෂණ 4ක් ලියන්න.

ii) ආහාරයක් නරක් වීමට බලපාන මූලික සාධක 3ක් ලියන්න.

iii) ආහාරයක් කල් තබා ගැනීමේදී තාක්ෂණික ක්‍රම 3ක් ලියන්න.

iv) ආහාරයක් නරක් වීම කෙරෙහි බලපාන ජීව ක්‍රියා 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

6

i) ප්‍රචාරණයේ මූලික අංග 3ක් දක්වන්න.

ii) වෙළෙඳ පොලක් යනු කුමක්ද?

iii) අලෙවි ප්‍රවර්ධනයේ මූලික අංග 2ක් ලියන්න.

iv) නිශ්පාදන ආශ්‍රිත ගැටලු තුනක් කෙටියෙන් විස්තර කරන්න.

REGISTRAR
De Mazenod College
Kandana.

ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු	......
ලිඛිත පරීක්ෂණයේ ලකුණු	......
මුළු ලකුණු	......